# සක් දෙවිඳු හා ගුරුත්වාකර්ෂණය

සක් දෙවිඳු ගුත්තිල පඬිතුමා හමුවීමට ඇත්තට ම පැමිණියේ ද? එසේ නැත්නම් අප කලින් ගුත්තිල විචාරයක සඳහන්කළ අයුරින් ඒ හුදෙක් මනසේ ඇති වූ ප්‍රබල වෙනසක් ගෙනහැර දැක්වීමක් පමණක් ද? අපට මුල් ප්‍රශ්නය තවත් පළල්කර සක් දෙවිඳු ඇත්තට ම සිටියේ ද? දැනුදු සිටින්නේ ද? ආදී ප්‍රශ්න ඇසිය හැකි ය. සක් දෙවිඳු හා ගුරුත්වාකර්ෂණය යන සංකල්ප අතර ඇති වෙනස කුමක් ද? පොළොවට පොල් (සහ අනෙක් වස්තු) වැටෙන්නේ ඇයි ද යන්න තේරුම්ගැනීමේ දී ගුරුත්වාකර්ෂණය යන සංකල්පය වැදගත් වෙයි. එසේ වුවත් එවැනි බලයක් හෝ ක්ෂේත්‍රයක් හෝ නොමැති යැයි අපි කියමු.

ඇතැමුන්ට අනුව සක් දෙවිඳු යනු එකල පර්සියාවේ විසූ ඩේරියස් රජු ය. ඩේරියස් රජු චක්‍රවර්ති රජු ලෙස සලකන්නෝ ද වෙති. පැරණි දඹදිව චක්‍රවර්ති රාජ්‍ය සංකල්පය මෙන් ම ශක්‍ර දේවේන්ද්‍ර සංකල්පය ද විය. පර්සියාවේ රජකළ ඩේරියස් රජු ඉතා බලසම්පන්න විය. ඒ රජු හේතුකොටගෙන සක්විති රජු යන සංකල්පය හා සක් දෙවිඳු යන සංකල්පය ඇති වී යැයි ඒ ඒ උගත්තු සිතති. සක්විති රජු යනු මෙලොව ජීවත්වූ රජකු පිළිබඳ සංකල්පයකි. එබැවින් ඩේරියස් රජු එකල සක්විති රජු වන්නට ද ඇත.

එහෙත් සක් දෙවිඳු යන්න එසේ නො වෙයි. සක් දෙවිඳු ජීවත්වන්නේ දෙව්ලොව ය. ඔහු සදෙව්ලොවට ම අධිපති වෙයි. මෙලොව ජීවත් වූ අයකු සක් දෙවිඳු ලෙස සැලකිය නො හැකි ය. සක් දෙවිඳු ඩේරියස් රජු ලෙස ගැනීමෙන් කෙරෙන්නේ එක් පැත්තකින් සක් දෙවිඳු යන සංකල්පය පාරභෞතික (metaphysical) තත්වයෙන් මුදාගැනීම ය. අනෙක් පැත්තෙන් එවැනි පාරභෞතික සංකල්පයක් නිර්මාණයකිරීමේ දී බල පෑ භෞතික සාධකය හෙළි පෙහෙළි කරගැනීම ය.

එහෙත් අප දන්නා සක් දෙවිඳු තවමත් ජීවත්වෙයි. බොහෝ කලකින් මිනිස් ලොවට පැමිණි බවට ආරංචියක් නොමැති නමුත් එතුමා එකල ඇතැම් අවස්ථාවල මනු ලොව පැමිණ ඇත. කාලය වශයෙන් ගත්කල අවසාන වශයෙන් සක් දෙවිඳු ගැන අසන්නට ඇත්තේ විජය රජු සම්බන්ධ සිද්ධියේ දී ය. විජය රජු ලංකාවට පැමිණෙන විට ඔහුට ආරක්ෂාව දීම සඳහා සක් දෙවිඳු යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙළේ ය.

සක් දෙවිඳු ඇත්තට ම ජීවත්වන්නේ ද නැත් ද ආදී ප්‍රශ්නවල වැදගත්කමක් නැත. මෙහි ඇත්තට ම යන්නෙන් අදහස්කරන්නේ කුමක් ද? අප එතරම් ඒ ගැන නොසිතුව ද, ඇත්ත යනු ඇති දෙය ය. සත්‍යය යන්නෙහි ද තේරුම ඇති, එසේත් නැත්නම් පවත්නා බව ය. දර්ශනයෙහි සත්භාව (ontological) යන්න පැවතීම හා බැඳෙයි. යමක් පවතී ද ඒ ඇත්ත වෙයි. එබැවින් ඇත්තට ම පවතී ද ඇත්තට ම ජීවත්වන්නේ ද ආදියෙහි එක්තරා ආකාරයක පුනරුක්තියක් වෙයි. එබැවින් අපට දැනගැනීමට අවශ්‍යවන්නේ සක් දෙවිඳු ජීවත්වන්නේ ද යන්න ය.

සක් දෙවිඳු නොව මේසය යනුවෙන් දෙයක් පවතී ද යන්නට දියහැකි පිළිතුර කුමක් ද? මේසය, පුටුව, පෑන, පැන්සල ආදිය පමණක් නොව "මම" ද නැත. ඒ සියල්ල මනසෙහි නිර්මාණ වෙයි. එපමණක් නොව මනස ද මනසෙහි නිර්මාණයකි. ගුරුත්වාකර්ෂණය ද මනසෙහි නිර්මාණයකි. නිව්ටන් විද්වතාගේ මනසෙහි ගුරුත්වාකර්ෂණ බලය සඳහා සූත්‍රයක් නිර්මාණයවීමට පළමුව භාරතීයයන්ගේ මනස්වල ගුරුත්වාකර්ෂණ සංකල්පය නිර්මාණය වී තිබුණි.

එහෙත් මේ නිර්මාණවල යම් සංගතබවක් වෙයි. අපි ගුරුත්වාකර්ෂණය හැරෙන්නට අනෙක් නිර්මාණ දකිමු. අපි ඒ ස්පර්ශකරමු. අපට සංගීතය ඇසෙයි. අපට මලක සුවඳ දැනෙයි. ඇතැම් දෑ භෞතික ව ඇතැයි අපි විශ්වාසකරමු. සාමාන්‍යයෙන් පංචේන්ද්‍රියන්ට ගෝචර වන දෑ භෞතික ව ඇතැයි අපි සිතමු. එහෙත් ඇතැම් විට පංචේන්ද්‍රියන්ට හසුවන පුටුව මේසය ආදිය පමණක් නොව පංචේන්ද්‍රියන්ට හසුනොවන ගුරුත්වාකර්ෂණය ද ඇතැයි සිතීමට අපට උගන්වා ඇත. අප ලවා එසේ විශ්වාසකරවීමට හැකි වී ඇත්තේ එක් අතකින් බටහිර විද්‍යාවට අද ලෝකයේ හිමි වී ඇති ආධිපත්‍යය හේතුකොටගෙන ය. අනෙක් අතට ගුරුත්වාකර්ෂණ නියමය යොදාගෙන ඇතැම් නිරීක්ෂණ තේරුම්කිරීමට හැකිවීම ය.

© Prof. Nalin De Silva

එහෙත් අප බොහෝ අවස්ථාවල පෙන්වා දී ඇති පරිදි නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයට සූර්යයා වටා ග්‍රහ වස්තුවල චලිතය නිසියාකාරව තේරුම්කිරීමට නො හැකි ය. ග්‍රහවස්තු සූර්යයා වටා අචල ඉලිප්සවල ගමන්නොකරන නමුත් නිව්ටෝනීය ප්‍රවාදයට අනුව එලෙස ගමන්කළ යුතු ය. එසේ අසංගතබවක් තිබිය දී ද අපි තවමත් නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය පිළිගනිමු. පොළොවෙහි හා ආසන්නයෙහි සිදුවන ප්‍රක්ෂිප්ත ආදී චලිත නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ඇසුරෙන් තේරුම්ගැනීමට හැකිවීම එයට එක් හේතුවක් වෙයි.

ඊනියා යථාර්ථවාදීන් පංචේන්ද්‍රියයන්ට ගෝචරවන භෞතික පැවැත්ම ගැන අවධාරණයක් කළ ද, ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය පිළිදගැනීමෙන් පෙනී යන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට යමක් ඇතැයි පිළිගැනීමට පංචේන්ද්‍රියයන්ට ගෝචර භෞතික පැවැත්මක් අනිවාර්ය නොවන බව ය. යමක් ඇතැයි පිළිගැනීමට එවැනි පැවැත්මක් ප්‍රමාණවත් වෙයි. එහෙත් අනිවාර්ය නො වෙයි. පාරභෞතික යන්න භෞතිකත්වය ඉක්මවූ හෝ භෞතික නොවන හෝ ආදී වශයෙන් තේරුම්ගතහොත් ගුරුත්වාකර්ෂණය පාරභෞතික ලෙස ගැනීමට සිදුවෙයි.

එහෙත් බටහිරයෝ ද ඔවුන් අනුකරණයකරන මෙරට උගත්තු ද ගුරුත්වාකර්ෂණය පාරභෞතික ලෙස නොසලකති. එයට හේතුව ගුරුත්වාකර්ෂණය සෘජුව පංචේන්ද්‍රියයන්ට හසු නොවුණ ද, වක්‍රව හසුවීම යැයි කෙනකුට කිවහැකි ය. ගුරුත්වාකර්ෂණය අපට නොපෙනුණ ද, ගුරුත්වාකර්ෂණය යටතේ පොල් වැටෙනු පෙනෙයි. එහෙත් අප බටහිර විද්‍යාඥයකුගෙන් පොල් එසේ වැටෙන්නේ ගුරුත්වාකර්ෂණය නිසා ම දැයි ඇසුවහොත් ඔහු අමාරුවේ වැටෙනු ඇත. අයින්ටයින් විද්වතාට අනුව පොල් වැටෙන්නේ අවකාශ කාලයේ වක්‍රතාව නිසා ය.

කිනම හේතුවක් දී හෝ ගුරුත්වාකර්ෂණය පාරභෞතික නො වේ යැයි සැලකීමට කැමති උගත්තු තම ඊනියා පණ්ඩිතමානී බව හා බටහිරට තමන්ගේ ඇති ගැති බව ප්‍රදර්ශනයකරමින් සක් දෙවිඳු පාර භෞතික යැයි සලකති. බටහිරයන් බොහෝ දෙනකුට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්ථානය, මළවුන්ගෙන් නැගිටීම පාර භෞතික වූවක් නො වෙයි. අපි එය පසෙකින් තබමු. සක් දෙවිඳු පාරභෞතික වීමටත් ගුරුත්වාකර්ෂණය පාරභෞතික නොවීමටත් හේතුව කුමක් ද? සක් දෙවිඳු මෙන් ම ගුරුත්වාකර්ෂණය ද අපේ පංචේන්ද්‍රියයන්ට ගොදුරු නො වෙයි. ගුරුත්වාකර්ෂණය අපේ පංචේන්ද්‍රියයන්ට  ගොදුරු නොවුණත් සක් දෙවිඳුන් හමු වූ අය ගැන පොතපතෙහි සඳහන් වෙයි. එවැනි අයගේ අත්දැකීම් අප නොසලකා සිටින්නේ ඇයි?

ඒ අත්දැකීම් පොතට පමණක් සීමාවේ යැයි කියන්නන් සිටිය හැකි ය. අද කිසිවකුටවත් සක් දෙවිඳුන් මුණ නොගැසෙන්නේ ඇයි දැයි කිසිවකුට ඇසිය හැකි ය. එයට හේතුව අද කිසිවකුවත් ඒ සඳහා අවශ්‍ය මානසික තත්වයට පත් නොවීම යැයි කිවහැකි ය. සක් දෙවිඳු හා මිනිසුන් අතර ගණුදෙනු සිදුවන්නේ භෞතික ශරීර ඔස්සේ, එනම් පංචේන්ද්‍රිය මගින්, නොවේ යැයි ගත්කල සංගත කතන්දරයක් හෙවත් ප්‍රවාදයක් ගොඩනගාගත හැකි ය. ඒ ප්‍රවාදය නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයට වඩා සංගත මෙන් ම  ඊනියා පර්යේෂණවලට භාජනය කළහැකි ආකාරයෙන් නිර්මාණය  කළ හැකි ය.

මෙහි දී අපට ඇති විකල්ප දෙක කවරේදැයි වැඩිදුර යෑමට පෙර නැවතත් මතක් කරගත යුතු ය. එක් විකල්පයකට අනුව අපි ගුත්තිල පඬිතුමා සක් දෙවිඳුන් මුණ ගැසීම යනු පඬිතුමාගේ සිතේ ඇතිවූ කම්පනය හේතුකොටගෙන ඇති වූ චිත්ත පරම්පරාවක් ලෙස විවරණය කරමු. ඒ විවරණයට අනුව අපට ලැබෙන ගුත්තිල පඬිවරයාට ඊනියා පාරභෞතික සක් දෙවිඳු මුණ නොගැසෙයි. එලෙස අපට ඊනියා පාරභෞතිකයෙන් ගැලවිය හැකි ය. එහෙත් ඒ විවරණය අවසාන විග්‍රහයෙහි දී බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි කෙරෙන්නකි. අප එහි දී  අළුත් අර්ථකථනයක් දෙන්නේ කෙසේ යෝ මෙවැනි පාරභෞතික සංකල්ප නැතිව ඊනියා යථාර්ථය නිරූපණය කළ හැකි ය යන්න පාඨකයන්ගේ හිතට කාවද්දන අදුරින් ය.

අනෙක් විකල්පය නම් සක් දෙවිඳුගේ ඊනියා  පාරභෞතිකය නොසලකා හැරීම ය. සක් දෙවිඳු අඩුම තරමින් ගුරුත්වාකර්ෂණය වැන්නක්, එහෙත් ජීවියකු, ලෙස සැලකීම ය. එසේත් නැතහොත් එයට වඩා දුරගොස් සක් දෙවිඳු වෙනත් පුද්ගලයකු ලෙස සැලකීම ය. ගුරුත්වාකර්ෂණය වැන්නක් ලෙස සැලකීමෙහි දී සිදුවනුයේ සක් දෙවිඳුගේ

© Prof. Nalin De Silva

පැවැත්මක් නැතත් (භෞතික, එනම් වක්‍රව හෝ සෘජුව ඉන්ද්‍රිය ගෝචරවන, පැවැත්මක් නැතත්) ඒ සංකල්පයෙන් යම් යම් දේ තේරුම්ගැනීම ය. එහෙත් සක් දෙවිඳු පුද්ගලයකු ලෙස ගැනීමේ දී එයට වඩා දෙයක්  සිදුවෙයි. ඒ පුද්ගලයා අප සියල්ලන්ට ම දැකිය හැකි ද නැත් ද යන්න මෙහි දී අදාළ නො වෙයි. ඉතිහාසයේ දී ඇතැම් පුද්ගලයන් සක් දෙවිඳු දැක ඇති බව කියැවෙයි.

එසේ නැතත් කිසිවකු නොදුටු පමණින්, එනම් මනුෂ්‍යයන් ලෙස ඉපදුන කිසිවකු පංචේන්ද්‍රියන් ඇසුරෙන් සක් දෙවිඳු ග්‍රහණය නොකරගත් පමණින් සක් දෙවිඳු නැතැයි කියන්නේ නම් ක්වොන්ටම් අංශුවල පැවැත්ම පිළිබඳ සාකච්ඡාකරන විට ඒ අංශුවල ඇතැම් ගුණ නැතැයි කීමට ද සිදුවෙයි. එහෙත් බටහිර භෞතික විද්‍යාඥයන් එයට සූදානම් නැති බව අපි දනිමු. එසේ නම් අප සක් දෙවිඳු නැතැයි කියන්නේ ඊනියා යථාර්ථවාදීන් කිහිප දෙනකු සතුටු කිරීමට ද?

මෙහි දී අපට තවත් කරුණක් ගැඹුරින් සාකච්ඡාකිරීමට සිදුවෙයි. සාහිත්‍ය විචාරයෙන් ඈතට යෑමට සිදුවුවත් අප එය කළයුතු ය. වක්‍රව ඉන්ද්‍රියගෝචරවන සංකල්ප ගැන අපි සඳහන් කෙළෙමු. ගුරුත්වාකර්ෂණය ඒ සඳහා උදාහරණයක් ලෙස ද ගත්තෙමු. ගුරුත්වාකර්ෂණය දක්නට නැතත් ඒ යටතේ වැටෙන පොල් දැකිය හැකි යැයි කියැවෙන බවක් සඳහන්කෙළෙමු. එහෙත් ඒ සමග පොල් වැටීම වෙනත් අයුරින් ද තේරුම්ගත හැකි බව කීවෙමු. මේ සියල්ල විසින් අප යොමුකෙරෙන්නේ කුමකට ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva